**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**අධ්‍යාපන පීඨය**
**විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන**
**6 වන මට්ටම**
**අවසාන පරීක්ෂණය - 2025/2026**
**SNU6230 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පන්තිකාමර කළමණාකරණය**
**කාලය- පැය තුනයි. (03)**

---

**දිනය - 2026.06.28** **වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>01 වන කොටස</u>**

01. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SNE) පන්ති කාමර සැකසුමක "පන්ති කාමර කළමනාකරණය" යන්නෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

02. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SNE) පන්ති කාමර පරිසරයක ඵලදායී පන්ති කාමර කළමනාකරණයේදී ගුරුවරයා විසින් සලකා බැලිය යුතු අංශ පහක් (05) සඳහන් කරන්න.

03. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SNE) සැකසුම තුළ පන්ති කාමර ස්ථාපිත කිරීමට දායක වන සාධක පහක් (05) ලියන්න.

04. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා (SNE) පන්ති කාමරයෙහි සිසුන්ගේඅවධානය පාඩම කෙරෙහි තබා ගැනීම සඳහා ගුරුවරයෙකුට යෙදිය හැකි ශිල්පීය ක්‍රම පහක් (05) සඳහන් කරන්න.

05. වසර ආරම්භයේදී විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පන්ති කාමරයක් සකස් කිරීම සඳහා දෙමාපියන්ගේ සහාය ලබා ගැනීමට ගුරුවරුන්ට භාවිත කළ හැකි උපාය මාර්ග පහක් (05) සඳහන් කරන්න.

06. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පන්ති කාමර ගුරුවරයෙකුට සිසුන්ගේ හැසිරීම පාලනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි නීති පහක් (05) සඳහන් කරන්න.

07. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පන්ති කාමරයක සිසුන්ගේ බාධාකාරී හැසිරීම් අවම කිරීමට "සමීප පාලන" (Proximity Control) උපාය මාර්ග ගුරුවරුන්ට උපකාරී වන ආකාරය සුදුසු උදාහරණයක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පන්ති කාමරයක සිසුන් අතර ගුරුවරයෙකුට නිරීක්ෂණය කළ හැකි හැසිරීම් අක්‍රමතා වර්ග පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - වන කොටස

09. "ගුරුවරුන්ගෙන් ලැබෙන ධනාත්මක චිත්තවේගීය සහයෝගය විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ ඉගෙනුම් අත්දැකීම්, ඔවුන්ගේ පූර්ණ විභවය කරා ළඟා වීමට උපකාරී වේ."

(i.) චිත්තවේගීය හැසිරීම යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර ධනාත්මක චිත්තවේගීය හැසිරීම සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයෙකුට භාවිත කළ හැකි එක් **(01)** ශිල්පීය ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර දක්නට ලැබෙන චිත්තවේගීය හැසිරීම් ආබාධ (EBD) තුනක් **(03)** සඳහන් කර එම චිත්තවේගීය හැසිරීම් ආබාධ ඉවත් කිරීමට හෝ අවම කිරීමට භාවිතා කළ හැකි උපාය මාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. "මාර්ගෝපදේශනය, ඉවසීම සහ ධනාත්මක සහයෝගය ඇතිව, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ට ස්වයං විනය සංවර්ධනය කර නිවැරදි සමාජීය සහ චිත්තවේගීය හැසිරීම් ගොඩනගා ගත හැකිය."

(i.) ස්වයං කළමනාකරණ කුසලතා සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර නිරීක්ෂණය කළ හැකි නොගැලපෙන හැසිරීම් තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii.) ඉහත සඳහන් (ii කොටස) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර දක්නට ලැබෙන නොගැලපෙන හැසිරීම් නැවැත්වීමට හෝ අවම කිරීමට ස්වයං කළමනාකරණ කුසලතා උපකාරී වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. "අවබෝධය, සහයෝගීතාව සහ අන්තර්කරණ ඉගැන්වීම් තුළින්, ගුරුවරුන්ට සෑම සිසුවෙකුටම අර්ථවත් සමාජ සම්බන්ධතා ගොඩනඟා ගැනීමට සහ සාර්ථක වීමට උපකාර කළ හැකිය."

(i.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර අන්‍යෝන්‍ය සබඳතා ගොඩනැගීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර අන්‍යෝන්‍ය සබඳතා වර්ධනය කිරීමේදී ගුරුවරුන් මුහුණ දෙන අභියෝග තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් අතර ඉහත (ii කොටස) සඳහන් කළ අභියෝග අවම කිරීමට හෝ ජය ගැනීමට සුදුසු උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

12. "සෑම දරුවෙකුටම ධනාත්මක සමාජීය හා චිත්තවේගීය සංවර්ධනයක් කරා මඟ පෙන්වීම, සහාය දීම සහ දිරිගැන්වීම සඳහා සහයෝගී පන්ති කාමර ගුරුවරයෙකු වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි."

(i.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර සමාජ කුසලතා සංවර්ධනය කිරීමේ වැදගත්කම් දෙකක් **(02)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් අතර සමාජ කුසලතා වැඩිදියුණු කළ හැකි ක්‍රියාකාරකමක් පියවර සහිතව ලියන්න. (ලකුණු 06)

(iii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පන්ති කාමර කළමනාකරුවෙකු ලෙස ඔබ විසින් ඉටු කරන ලද ඕනෑම භූමිකාවන් හතරක් **(04)** විස්තර කරන්න. (ලකුණු 10)

13. "ධනාත්මක අන්තර්කරණ පන්ති කාමර පරිසරයක් සෑම සිසුවෙකුටම ඔවුන්ගේ වෙනස්කම් නොසලකා, ගෞරවය, සහභාගීත්වය සහ සමාන ඉගෙනුම් අවස්ථා දිරිමත් කරයි. "

(i.) "අන්තර්කරණ පන්ති කාමරයට අදාළව ධනාත්මක පන්ති කාමර පරිසරය" යන්නෙහි අදහස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ධනාත්මක අන්තර්කරණ පරිසරයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ගුරුවරුන් මුහුණ දෙන ඕනෑම අභියෝග තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) ගුරුවරයෙකු ලෙස ඉහත (ii කොටස) සඳහන් අභියෝග අවම කිරීමට හෝ ජය ගැනීමට ඔබට දායක විය හැකි ආකාරය පැහැදිලි කරන්න. සුදුසු උදාහරණ තුනක් **(03)** දක්වන්න. (ලකුණු 10)

14. "ඵලදායී පන්ති කාමර කළමනාකරණය සෑම සිසුවෙකුටම සාර්ථක වීමට අවස්ථාව ඇති ආරක්ෂිත සංවිධානාත්මක සහ අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරයි."

(i.) ඵලදායී පන්ති කාමර කළමනාකරණය පිළිබඳ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) අන්තර්කරණ සැකසුම සඳහා ඵලදායී පන්ති කාමර පරිසරයක් ස්ථාපිත කිරීමේදී සලකා බැලිය යුතු ඕනෑම සාධක තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 06)

(iii.) අන්තර්කරණ සැකසුමක ඵලදායී පන්ති කාමර කළමනාකරණයක් පවත්වා ගැනීමෙන් ගුරුවරයෙකුට ලබාගත හැකි ප්‍රතිලාභ හතරක් **(04)** කෙටියෙන් පැහැදිලි කරන්. (ලකුණු 10)

\- සියලුම හිමිකම් ඇවිරිණි. -